# අත්තනෝමතිකව වෙබ් අඩවි අවහිර කිරීම සහ ලියාපදිංචි කිරීම: අන්තර්ජාලයේ අදහස් ප්‍රකාශන නිදහස අඛණ්ඩව උල්ලංඝනය කිරීම

*2011 නොවැම්බර් 9, කොළඹ:*

පහත අත්සන් කරන සිවිල් සංවිධාන සහ පුරවැසියන් වන අප, 2011 නොවැම්බර් 5 දා රජයේ තොරතුරු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා නිකුත් කල මාධ්‍ය නිවේදනය කෙරෙහි අප තුළ පවත්නා බලවත් අවධානය ප්‍රකාශයට පත් කර සිටිමු. 'ශ්‍රී ලංකාවට හෝ ශ්‍රී ලංකාවේ ජනතාවට අදාළ කවර හෝ අන්තර්ගතයක් දරා සිටින, ශ්‍රී ලංකාවේ සිට හෝ අන් තැනක සිට අන්තර්ජාලයට මුදා හැරෙන' සියලු 'වෙබ් අඩවි' 'ලියාපදිංචි' කොට 'නිල පිළිගැනීම' ලබා ගත යුතු යැයි, එම නිවේදනය ඉල්ලා සිටී. අපි විදුලි සංදේශ නියාමන කොමිසමේ (විසංනිකො) ගත් පියවරයන් ද හෙළා දකිමු. *සන්ඬේ ටයිම්ස්* පුවත්පතෙහි පළ වුණු ප්‍රවෘත්ති වාර්තාවකට අනුව, මෙම නිවේදනය නිකුත් වීමත් සමඟ ම එම කොමිසම සුවිශේෂ වෙබ් අඩවි ගණනාවක් අවහිර කිරීමට පියවර ගත්තේ ය. නිවේදනය නිකුත් කිරීම සහ වෙබ් අඩවි අවහිර කිරීම යන මෙම පියවරයන් දෙක එකම මුල පිරීමක කොටස් දෙකක් ද යන්න පැහැදිලි නැතත්, ඉන් නියෝජනය වන්නේ ශ්‍රී ලංකාව තුළ අදහස් ප්‍රකාශනයේ නිදහසට බරපතල තර්ජනයක් එල්ල කිරීමකි.

මාධ්‍ය නිවේදනය නිකුත් කෙරුණු දා ම, www.lankanewsweb.com, www.srilankamirror.com, www.srilankaguardian.org සහ www.lankawaynews.com ඇතුළු වෙබ් අඩවි අවහිර කරනු ලැබිණ. කිසිදු අදහස් විමසීමකින් හෝ පූර්ව අනතුරු ඇඟවීමකින් තොරව ගනු ලැබුණු මෙම පියවර හරහා ඉස්මතු වෙන ආණ්ඩුවේ සැබෑ අරමුණු කවරේ ද යන්න පිළිබඳවත්, ශ්‍රී ලංකාව තුළ අදහස් ප්‍රකාශනයේ නිදහසට එයින් එල්ල වන අභියෝගය පිළිබඳවත් අපේ බලවත් අවධානය යොමු වී ඇත.

අදාළ 'ලියාපදිංචි වීමේ' ක්‍රියාවලිය කුමක් ද යන්නත්, කුමන හෝ ආකාරයක බැඳී සිටීම් හෝ කොන්දේසි පනවනු ලබන්නේ ද යන්නත්, තොරතුරු දෙපාර්තමේන්තුවේ මාධ්‍ය නිවේදනයෙන් ප්‍රකාශ නොවන බව අපි සඳහන් කර සිටිමු. එමෙන් ම, ආණ්ඩුව ගත් මෙම පියවර, ප්‍රවෘත්ති වෙබ් අඩවි අධිකාරය යටතේ ලියාපදිංචි කිරීම අනිවාර්ය වන නීතියක් කෙටුම්පත් කිරීම සඳහා, 2010 දී විදුලි සංදේශ නියාමන කොමිසම සාකච්ඡාවට ලක් කළ සැලසුම් මුදුන් පමුණුවා ගැනීමෙහි ලා ගත් පළමු පියවර බව ද අපි තව දුරටත් සඳහන් කර සිටිමු.

මාධ්‍ය නිවේදනය සම්බන්ධයෙන් තවත් අමතර සැලකිලිමත් වීම් ද අපට ඇත. පළමු වැන්න නම්, අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි විය යුත්තේ කවර වෙබ් අඩවි හෝ පුද්ගලයන් දැයි, වර්ගීකරණ සහිත ප්‍රමාණවත් පැහැදිලි කිරීමක් මාධ්‍ය නිවේදනයෙන් සිදු නොවීම යි. දෙවැන්න නම්, ලියාපදිංචි වීමේ මෙම අවශ්‍යතාව, ශ්‍රී ලංකාව පිළිබඳව සහ ශ්‍රී ලංකාව තුළ ප්‍රවෘත්ති පළ කරන ජාත්‍යන්තර ප්‍රවෘත්ති වෙබ් අඩවිවලට සහ ජාත්‍යන්තර සංවිධානවලින් පවත්වා ගෙන යන වෙබ් අඩවිවලට අදාළ වන්නේ ද, එසේ නම් ඒ කෙසේ ද යන්න පැහැදිලි නොවීම යි. අවසන් වශයෙන්, විනිවිද භාවයෙන් යුතු වීමේ, අනුකූල වීමේ සහ සමාන ලෙස සැලකීමේ අවශ්‍යතා අනුව සලකන විට, මෙම ආකාරයේ ලියාපදිංචි කිරීමක් බලාත්මක කළ හැක්කේ කුමන නීතිමය රාමුවක් සහ ක්‍රියාවලියක් යටතේ දැයි පැහැදිලි කිරීම, තොරතුරු දෙපාර්තමේන්තුවේ සහ විදුලි සංදේශ නියාමන කොමිසමේ වගකීමක් බව සඳහන් කර සිටිමු.

වෙබ් අඩවි අවහිර කිරීම සමඟ ඈඳී ආ, කල් තියා වාරණය කිරීමේ ආකාරයක් විය හැකි ලියාපදිංචි කිරීමේ මෙම අවශ්‍යතාව, අන්තර්ජාලීය අදහස් ප්‍රකාශන සහ තොරතුරු නිදහසට භයංකර බලපෑමක් කරනවා පමණක් නොව, අදහසක් දැරීමට සහ ප්‍රකාශනයට පුද්ගලයාට ඇති අයිතිය සහතික කරන ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(අ) වගන්තිය ඇතුළු

ව්‍යවස්ථානුකූලව සුරක්ෂිත මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් බව ද පෙනේ. ජාත්‍යන්තර ප්‍රමිතීන් කෙරෙහි ආණ්ඩුවට පවතින බැඳීම්වලින් පැහැදිලි වන්නේ, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR) ඇතුළු බලාත්මක කළ හැකි ජාත්‍යන්තර නීතිමය මෙවලම්, ශ්‍රී ලංකාව විසින් අනුමත කොට ඇති බව යි. එමෙන් ම, උදාහරණයක් ලෙස, අදහස් සහ මත ප්‍රකාශ කිරීමේ නිදහස සම්බන්ධ එක්සත් ජාතීන්ගේ විශේෂ සබැඳියාකරු *ෆ්‍රෑන්ක් ලා රූ* 2011 මැයි 16 දා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම (UNHRC) වෙත ඉදිරිපත් කළ වාර්තාවේ ඇතුළත් ජාත්‍යන්තර යහපරිචයන් පිළිබඳ ප්‍රමිතීන් ද, මෙම පියවරයන්ගෙන් නොසැපිරෙන බව, අමුතුවෙන් කිව යුතු නොවේ.

අපකීර්තියට පත් කිරීම සහ පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතිය පිළිබඳව සැලකිලිමත් වීම් ඇති වී තිබිය දීත්, ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක සාරධර්මවලට හෝ අදහස් ප්‍රකාශනයේ නිදහසට නීතිමය සීමාවන් පැනවීමට අවසර ලැබෙන ජාත්‍යන්තර ප්‍රමිතීන්හි අඩංගු සාරධර්මවලට අනුරූප බව පෙන්වීම සඳහා, යුක්ති සහගත තර්කයක් සැපයීමට ආණ්ඩුව අසමත් වී ඇත. අපකීර්තියට පත් කිරීමක් හෝ පෞද්ගලිකත්වය පැහැර ගැනීමක් සම්බන්ධයෙන් නීතිමය පිළියම් යෙදීම සඳහා ශ්‍රී ලංකාවේ නීතිය යටතේ ප්‍රමාණවත් ප්‍රතිපාදන පවතින අතර, අමාත්‍යාංශය මේ තාක් ගෙන ඇති පියවරයන්, අන්තර්ජාලීය මාධ්‍ය ආචාර ධර්ම සහතික කිරීම යන එය විසින් ප්‍රකාශිත අරමුණට ද නුසුදුසු සහ නොසැසඳෙන්නේ වේ. තව ද, එවන් අත්තනෝමතික අවහිර කිරීම්වල ප්‍රායෝගිකත්වය ද ප්‍රශ්නයට බඳුන් වන්නකි. වෙබ් අඩවි මත පුළුල් අවහිර කිරීම් පැනවීමට දරන ඕනෑ ම ප්‍රයත්නයක්, එම වෙබ් අඩවි කෙරෙහි පවතින උනන්දුවත්, අවහිර කිරීම් මග හැර මෙම අඩවිවලට ප්‍රවේශ වීම සඳහා, පුළුල්ව සපයා ගත හැකි උපායාත්මක මෙවලම් (සහ බලගතු ආදේශක සේවා සම්පාදකයන්) යොදා ගැනීමත්, වැඩි වීමට හේතු වේ.

වෙබ් අඩවි අවහිර කිරීම ව්‍යවස්ථා විරෝධී ය, නිදහස් මතයට එරෙහි ය, තාක්ෂණිකව කළ නොහැකි දෙයකි. එවන් අත්තනෝමතික සහ නීතියෙන් පිටස්තර පියවරක ප්‍රතිවිපාකය වන්නේ, පටු පක්ෂග්‍රාහී අවශ්‍යතා රැක ගැනීමේ වුවමනාවෙන් ආණ්ඩුවේ අධිකාරීන් කරන පෞද්ගලික විනිශ්චයන් මත එම සීමා කිරීම් පදනම් වීම, අදහස් ප්‍රකාශනයේ නිදහස පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන් මුළුමනින් උල්ලංඝනය කිරීම සහ විරුද්ධ මත සඳහා ඇති අයිතිය කඩ කිරීම යි. වෙබ් අඩවි අවහිර කිරීම සඳහා ආණ්ඩුව අත්තනෝමතික නියෝග නිකුත් කළ විට අන්තර්ජාල සේවා සම්පාදකයන් (ISP) යටහත් පහත්ව ඒවාට එකඟ වීම ගැන ද සැලකිලිමත් වන අපි, එවන් යටත් වීම්වලින් සිදු වන්නේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනයෙහි ලා සහාය වීමක් බව ඔවුන්ට මතක් කර දෙන්නෙමු.

අදහස් ප්‍රකාශනය, තොරතුරු දැන ගැනීම සහ මත පළ කිරීම සඳහා වන නිදහස සම්බන්ධ මූලික අයිතිවාසිකමට, අන්තර්ජාලයෙහි පවත්නා විවිධ තොරතුරු මූලාශ්‍ර වෙත පුළුල්ව ප්‍රවේශ වීමේ අයිතිය ද ඇතුළත් බව යළි ප්‍රකාශ කර සිටින අපි, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ නිවේදනයෙහි අඩංගු ලියාපදිංචි වීමේ අවශ්‍යතාව අවලංගු කළ යුතු යැයි ආණ්ඩුවට බලකර සිටිමු.

01) අනෝමා රාජකරුණා
02) යුද්ධයෙන් විපතට පත් වූ කාන්තාවන්ගේ සංගමය
03) සෙඩ්‍රික් ද සිල්වා
04) විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
05) චන්ද්‍රා ජයරත්න
06) චන්ද්‍රගුප්ත තේනුවර
07) චූලනී කොඩිකාර
08) ඩියාන් උයන්ගොඩ
09) ආචාර්ය දෙවනේසන් නේසයියා
10) දිල්රුක්ෂි හඳුන්නෙත්ති
11) එමිල් වැන්ඩර් පූටන්
12) ඉක්වූල් ග්‍රවුන්ඩ්
13) අතුරුදහන් වූවන්ගේ පවුල් එකතුව
14) ෆ්ලොප්ටින් ස්පේස් තියටර් කම්පැනි

15) නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
16) ගෞවතමන් බාලචන්ද්‍රන්
17) හර්මන් කුමාර, ජාතික ධීවර සහයෝගීතා ව්‍යාපාරය
18) ඉන්ෆෝම්
19) ඉමාර්ඩා ආසියානු කමිටුව
20) නීතිඥ ජේ. සී වැලිඅමුණ
21) ජයතිලක කම්මැල්ලවීර
22) ජොවිතා අරුලනාන්දම්
23) ජුවනිතා අරුලනාන්දම්
24) කේ. එස් රත්නාවලී
25) මහාචාර්ය කාලිංග ටියුඩර් සිල්වා
26) කෞෂල්‍යා ආටිගල
27) කනිෂ්ක රත්නප්‍රිය
28) ලක්ෂ්මන් ගුණසේකර, සභාපති, දකුණු ආසියානු නිදහස් මාධ්‍ය සම්මේලනය, ශ්‍රී ලංකා පාර්ශවය
29) ලංකා නේසයියා
30) නීතිඥ ලාල් විජේනායක
31) ප්‍රජාතන්ත්‍රවාදය සඳහා නීතිඥයෝ
32) ලුවී ගනේෂාතාසන්
33) මහේන්ද්‍රන් තෙරුවරන්ජන්
34) අචාර්ය මාරියෝ ගෝමස්
35) මරිසා ද සිල්වා
36) ලක්බිමේ මව්වරු සහ දියණියෝ
37) මුස්ලිම් කාන්තා පර්යේෂණ සහ ක්‍රියාකාරී  සංසදය
38) ජාතික සාම මණ්ඩලය
39) නිර්මාසුවාන් බාලසුන්දරම්
40) පීටර් රිසෙල් - කළමණාකාර සහ සංවර්ධන උපදේශක
41) ප්‍රියා තන්ගරාජා
42) ප්‍රියදර්ශනී ආරියරත්න- සමාජ ප්‍රජාතන්ත්‍රවාදී එකමුතුව
43) ආර්. එම්. බී. සේනානායක
44) රයිට් ටු ලයිෆ්-මානව හිමිකම් කේන්ද්‍රය
45) රයිට්ස් නව්-ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සාමූහිකය
46) රුකී ප්‍රනාන්දු
47) ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්
48) ෂාමිනි බොයිල්
49) ශාන්ති සචිතානන්දන්
50) ශානි ජයවර්ධන- ලේඛිකා සහ ඡායාරූප ශිල්පිනී
51) ෂිෆාන් අහමඩ්
52) සුභා විජේසිරිවර්ධන
53) සුමති සිවමෝහන්
54) ෂාමලා ගෝමස්
55) විලිඳු සංවිධානය
56) කාන්තා මධ්‍යස්ථානය-ජා-ඇල
57) කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය
58) කාන්තා දේශපාලන පීඨය - කොළඹ